**<u>2026.04.21 දින පෙ.ව. 09.30 ට බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල රැස්වීම් ශාලාවේ දී පවත්වන ලද බෙන්තොට ප්‍රාදේශීය සභාවේ 2026 අප්‍රේල් මස මාසික සභා රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි.</u>**

සහභාගිත්වය :-

1. ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමා - ගරු සභාපති
2. ඩබ්. ඩී. ප්‍රසන්න ප්‍රදීප් කුමාර ගුණවර්ධන මැතිතුමා - ගරු උප සභාපති
3. කේ. ඩී. මිගාර නේමින්ද වලල්ලාවිට මැතිතුමා - ගරු මන්ත්‍රී
4. පී. ලෙනිකා දූෂන්ති මැතිතුමිය - ගරු මන්ත්‍රිනී
5. ඩී. එම්. සී. තාරක විජේකෝන් මැතිතුමා - ගරු මන්ත්‍රී
6. ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා - ගරු මන්ත්‍රී
7. ආඩිගේ රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා - ගරු මන්ත්‍රී
8. උබේසිංහ ආරච්චිගේ රන්ජිත් මැතිතුමා - ගරු මන්ත්‍රී
9. ඩී. ඩී. නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී
10. එම්. ඩී. නිලුපුල් සම්පත් මැතිතුමා - ගරු මන්ත්‍රී
11. මද්දුමාතොටගේ නිශාන්ත කුමාර මැතිතුමා - ගරු මන්ත්‍රී
12. එම්. ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා - ගරු මන්ත්‍රී
13. සමිත ලක්මාල් පුංචිහේවා මැතිතුමා - ගරු මන්ත්‍රී
14. ඩබ්. ඩී. රුසිත නන්දන තුෂාර මැතිතුමා - ගරු මන්ත්‍රී
15. කේ. කේ. පුණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා - ගරු මන්ත්‍රී
16. නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා - ගරු මන්ත්‍රී
17. ලියනගමගේ අභයරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී
18. එච්. තිලක් උපුල් චමින්ද මැතිතුමා - ගරු මන්ත්‍රී
19. යූ. කේ. මධුභාෂිකා දිල්හානි මැතිතුමිය - ගරු මන්ත්‍රිනී
20. ඩී. නිස්සංක කුමාර දේශප්‍රිය මැතිතුමා - ගරු මන්ත්‍රී
21. බී. සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා - ගරු මන්ත්‍රී
22. ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී

සහභාගී නොවූ :-

1. ලියනගමගේ විජිත් සම්පත් මැතිතුමා - ගරු මන්ත්‍රී

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 9.30 ට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ගරු උප සභාපති ඩබ්. ඩී. ප්‍රසන්න ප්‍රදීප් කුමාර ගුණවර්ධන මැතිතුමා, ගරු මන්ත්‍රී කේ. ඩී. මිගාර නේමින්ද වලල්ලාවිට මැතිතුමා, ගරු මන්ත්‍රිනී පී. ලෙනිකා දූෂන්ති මැතිතුමිය, ගරු මන්ත්‍රී ඩී. එම්. සී. තාරක විජේකෝන් මැතිතුමා, ගරු මන්ත්‍රී ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා, ගරු මන්ත්‍රී ඩී. ඩී. නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා, ගරු මන්ත්‍රී එම්. ඩී. නිලුපුල් සම්පත් මැතිතුමා, ගරු මන්ත්‍රී මද්දුමාතොටගේ නිශාන්ත කුමාර මැතිතුමා, ගරු මන්ත්‍රී එම්. ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා, ගරු මන්ත්‍රී සමිත ලක්මාල් පුංචිහේවා මැතිතුමා, ගරු මන්ත්‍රී ඩබ්. ඩී. රුසිත නන්දන තුෂාර මැතිතුමා, ගරු මන්ත්‍රී කේ. කේ. පුණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා, ගරු මන්ත්‍රී නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා, ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා, ගරු මන්ත්‍රී

එච්. තිලක් උපුල් චමින්ද මැතිතුමා, ගරු මන්ත්‍රිනී යූ. කේ. මධුභාෂිකා දිල්හානි මැතිතුමිය හා ගරු මන්ත්‍රී ඩී. නිස්සංක කුමාර දේශප්‍රිය මැතිතුමා යන මහත්ම මහත්මීන්ගේ සහභාගීත්වයෙන් යුතුව සභාවේ කටයුතු ආරම්භ විය.

<u>ගරු සභාපතිතුමා විසින් සභාව පිළිගැනීම.</u>

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ලැබුවා වූ සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් සියලු දෙනාට සුභ පතමින් ගරු උප සභාපතිතුමා ඇතුළු සියලු සභිකවරු, ප්‍රාදේශීය සභා ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරීන් ද මාධ්‍යවේදී මහත්වරුන් ද සාදරයෙන් පිළිගන්නා ලදී.

**1. පසුගිය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම :-**

1.1. 2026.03.10 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

2026.03.10 දින පැවති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සභිකයින් වෙත මේ වන විට යොමු කර ඇති බවත්, එහි සංශෝධන තිබේ නම් ඒවාට යටත්ව වාර්තාව කියවූවා සේ සලකා සභාව මඟින් සම්මත කිරීමට කටයුතු කරන ලෙසත් සඳහන් කරන ලදී.

සංශෝධන ඉදිරිපත් නොවූ බැවින් 2026.03.10 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සංශෝධන රහිතව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් කරන ලද යෝජනාව, ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**2. ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන විශේෂ නිවේදන :-**

2.1. අංක SPLG/GL/B/BENPS/05/AQ/26/05/(i) හා 2026.03.19 දිනැති ලිපිය මඟින් වාහන පරීක්ෂාව හා වීථි පහන් සම්බන්ධව විගණකාධිපතිවරයා විසින් නිර්දේශ කරන ලද විගණන විමසුමක් ප්‍රාදේශීය සභාව වෙත ලැබී ඇති බවට සභාව දැනුවත් කරන ලදී.

2.2. අංක SPLG/GL/B/BENPS/05/AQ/26/05/(ii) හා 2026.03.23 දිනැති ලිපිය මඟින් වරිපනම් බදු, කඩ කාමර බදු හා සංචාරක හෝටල් බදු සම්බන්ධව විගණකාධිපතිවරයා විසින් නිර්දේශ කරන ලද විගණන විමසුමක් ප්‍රාදේශීය සභාව වෙත ලැබී ඇති බවට සභාව දැනුවත් කරන ලදී.

2.3. අංක SPLG/GL/B/BENPS/05/AQ/26/05/(iii) හා 2026.03.23 දිනැති ලිපිය මඟින් සැලසුම් කමිටු දීමනා ගෙවීම් පරීක්ෂාව, අත්තිකාරම් ගෙවීම් පරීක්ෂාව හා හිඟ සේවක ණය අයකර නොගැනීම සම්බන්ධව විගණකාධිපතිවරයා විසින් නිර්දේශ කරන ලද විගණන විමසුමක් ප්‍රාදේශීය සභාව වෙත ලැබී ඇති බවට සභාව දැනුවත් කරන ලදී.

2.4. අංක SPLG/GL/B/BENPS/05/AQ/26/05/(iv) හා 2026.03.23 දිනැති ලිපිය මඟින් බෙන්තොට හොරවල තොටුපල හන්දියේ සිට ඉත්තැපාන තොටුපල දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තය පරීක්ෂාව, බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේත් බිම් මහල හා ඉතිරි අලුත්වැඩියාවන් සිදු කිරීමේ කර්මාන්තය පරීක්ෂාව, ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිත කිරීම, දෛනික පදනමින්

පෙර පාසල් ගුරුවරියක් ලබා ගැනීම, රාජකාරී පැවරීම් පරීක්ෂාව, කාර්ය මණ්ඩල පුරප්පාඩු හා අතිරික්තතා සහ ස්ථාන මාරු ප්‍රතිපත්තිය කියාත්මක කිරීම සම්බන්ධව විගණකාධිපතිවරයා විසින් නිර්දේශ කරන ලද විගණන විමසුමක් ප්‍රාදේශීය සභාව වෙත ලැබී ඇති බවට සභාව දැනුවත් කරන ලදී.

**3. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන ගරු සභාවට ඉදිරිපත් කිරීම :-** කිසිවක් නැත

**4. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න :-** කිසිවක් නැත

**5. යථා පරිදි කල් දී ඇති යෝජනා :-**

**5.1.** <u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා :-</u>

5.1.1. බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයට ලබා ගෙන ඇති පුද්ගලික ආරක්ෂක සේවාවේ ගිවිසුම් කාලය මැයි මස 31 වන දිනෙන් අවසන් වීමට නියමිතය. එබැවින් එදින සිට ඉදිරි වර්ෂයක කාලයකට ලංසු කැඳවීම් කර ප්‍රධාන කාර්යාලයේ ආරක්ෂක සේවාව පුද්ගලික අංශයෙන් සපයා ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

- මෙම අවස්ථාවේ දී පෙ.ව. 9.35 ට ගරු මන්ත්‍රී ආඬිගේ රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා හා ගරු මන්ත්‍රී උඩේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමා ගරු සභාවට පැමිණෙන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.2. ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ගබඩාවේ සහ ලේඛනාගාරයේ රාක්ක අලුතින් සකස් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.3. කාර්ය මණ්ඩලය සහ මන්ත්‍රී මණ්ඩලය වෙනුවෙන් ඔවුන්ගේ ආකල්ප සංවර්ධනය සහ ධාරිතා සංවර්ධනය අරමුණු කර ගත් පුහුණු වැඩසටහනක් සුදුසු සම්පත්දායකයෙකු මඟින් සිදු කිරීමටත්, ඒ සඳහා සභා අරමුදලින් රු. 50,000/- ක මුදලක් වැය දැරීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**

කාලානුරූපිව අවට පවතින සියලු දේ දිනෙන් දින වෙනස් වන ලෝකයේ අප සියලු දෙනාගේ ආකල්ප මෙන්ම බොහෝ දේ අලුත් විය යුතු බවට විශ්වාස කරන බවත්, ඒ වෙනුවෙන් මන්ත්‍රී මණ්ඩලය මෙන්ම කාර්ය මණ්ඩලය ද සහභාගී කරවාගෙන සියලු දෙනාගේ ආකල්ප සංවර්ධනය, සාමූහිකව වැඩ කටයුතු සිදු කරන ආකාරය මෙන්ම තනි පුද්ගලයෙකු ලෙස තම තමන්ගේ කාර්යයන්වල ගුණාත්මකභාවය වැඩි දියුණු කර ගනනේ කෙසේ ද?, පුද්ගලික පෞරුෂය වර්ධනය කර ගන්නේ කෙසේ ද?, සභාවක් ලෙස ඉදිරියට යන්නේ කෙසේ ද? ආදිය ඇතුළු කරුණු රාශියක් අරමුණු කරගත් වැඩසටහනක් සංවිධානය කිරීමට බලාපොරොත්තු වන බවත්, මේ සඳහා සුදුසු සම්පත්දායකයෙකු යොදාගැනීමටත්, සම්පූර්ණ දිනයක් හෝ දින භාගයක් මේ සඳහා යොදා ගැනීමට අදහස් කරන බවත්, සභාව පිහිටුවා වසරකට ආසන්න කාලයක් ගත වී ඇති නමුත් මෙතෙක් මන්ත්‍රීවරුන් හා කාර්ය මණ්ඩලයේ සියලු දෙනා සහභාගී වී සිදු කරන වැඩසටහනක් පැවැත්වීමට නොහැකි වූ බවත්, මෙම වැඩසටහන ඒ සඳහා අවස්ථාවක් කර ගත හැකි බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

- මෙම අවස්ථාවේ දී පෙ.ව. 9.38 ට ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා ගරු සභාවට පැමිණෙන ලදී.

5.1.4. සභාවේ සේවා අවශ්‍යතාවය මත සංචාරක සමය හා උත්සව සමයේ පවතින කටයුතු වෙනුවෙන් දකුණු පළාත් පාලන මිල නියම කිරීමේ කමිටු මිල ගණන් අනුව නුපුහුණු කම්කරුවන් 08 දෙනෙකු සේවයේ යොදවා ගැනීමට සභාවේ අනුමැතිය ලැබී ඇත. ඉන් 04 දෙනෙකු සේවා අවශ්‍යතාවය සමඟ සේවයේ යොදවා ගනු ලැබූ අතර සංචාරක සමය නිම වීමට ආසන්න වුව ද සභාවේ සෞඛ්‍ය හා මාර්ග අංශයේ පවතින පුරප්පාඩු හා සේවා අවශ්‍යතාවය සලකා මෙම කම්කරුවන් 2026 දෙසැම්බර් 31 දින දක්වා සේවයේ යොදවා ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**

විශ්‍රාම යාම, මිය යාම හා සේවය හැර යාම ආදී හේතු මත සුළු සේවක පුරප්පාඩු 08 ක් පවතින බවත්, මේ වන විට බඳවා ගැනීම් සඳහා ඉල්ලීම් සිදු කර ඇති නමුත් මෙතෙක් ඒ සඳහා අනුමැතිය ලැබී නොමැති බවත්, එතෙක් අවශ්‍යතාවය මත දැනට සේවකයන් 04 දෙනෙකුගේ සේවය යොදා ගනිමින් පවතින බවත්, මෙම සිව් දෙනාගේ සේවය දෙසැම්බර් මස 31 දින දක්වා දකුණු පළාත් පාලන මිල නියම කිරීමේ කමිටු මිල ගණන් යටතේ ලබා ගැනීම සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත් මෙහි දී සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.5. බෙන්තොට ප්‍රාදේශීය සභා ආදාහනාගාරයේ තීන්ත ආලේප කිරීම, පොළව ටයිල් කිරීම, ඇලුමිනියම් දොරවල් සහ වැහිපීළි සකස් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**

ආදාහනාගාරයේ නවීකරණයන් දීර්ඝ කාලයකින් සිදු කර නොමැති බවත්, පොළවේ ටයිල් තැනින් තැන මේ වන විට කැඩී ගොස් ඇති බවත්, තීන්ත ආලේපයක් පවා සිදු කර නොමැති බවත්, සභාව මඟින් ඉටු කරනු ලබන ප්‍රධානම සේවාවක් ලෙස ආදාහනාගාර කටයුතු පවතින බැවින් මෙම නවීකරණයන් සිදු කර එහි ස්ථානීය පෙනුම ඉහළ නැංවීම සුදුසු බවත්, මේ වන විට තාක්ෂණ සේවා නිලධාරී මහතා විසින් මේ සඳහා වන ඇස්තමේන්තු සකස් කර ඇති බවත්, නිසි ආකාරයෙන් එහි වැඩකටයුතු අවසන් කිරීම සුදුසු බවත් මෙහි දී සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.2. <u>ගරු මන්ත්‍රී, මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී ඇති යෝජනා:-</u>**

5.2.1. අංක 11 C ගලගම ග්‍රාම නිලධාරී වසමේ ගලගම රෝහල ඇතුළු ගෝනගල මිරිස්වත්ත ප්‍රධාන මාර්ගයට සම්බන්ධ වන ගලගම මුල්ලෙගොඩ මාර්ගයේ ඉතා අබලන් තත්ත්වයේ පවතින මීටර් 40 ක් පමණ වන මාර්ග කොටස කොන්ක්‍රීට් හෝ තාර යොදා ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී, මිගාර වලල්ලාවිට මැතිතුමා</u>**

මෙම මාර්ගයට ඇතුළු වන ස්ථානයේ කාණු පද්ධතිය පස් ඉවත් කර අවස්ථා දෙකක දී සකසා දුන් බවත්, නමුත් මෙහි ඉතිරි කොටස මල් ශාලාවට මෙපිටින් පාරවල් 2 ම අබලන් වී ඇති බවත්, ඒ හේතුවෙන් එම ගම්වාසීන් විසින් මාර්ග කොටස ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස ඉල්ලීමක් සිදු කර ඇති බවත්, තව ද මේ මාර්ගය සමඟම පවතින ගලගම ප්‍රධාන මාර්ගය දැඩි අබලන් තත්ත්වයේ පවතින බවත්, එම මාර්ගයේ කුඩා කොටසක් සඳහා පමණක් ප්‍රතිපාදන වෙන් වී ඇති බවත්, මෙම මාර්ගය ප්‍රදේශ ගණනාවකටම යාමට භාවිත කරන බවත් සඳහන් කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී, නිශාන්ත කුමාර මැතිතුමා</u>**

අබලන් තත්ත්වයේ පවතින මාර්ගයක් බැවින් එය ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බව සඳහන් කරන ලදී.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**

ප්‍රතිපාදන පවතින ප්‍රමාණය සලකා බලා ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බව සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.3. <u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-</u>**

5.3.1. ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ 2026 වර්ෂය සඳහා ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත සභාව සතු බෙන්තොට කෝම්මල සුගත වැඩිහිටි නිවාස පාර කාපට් කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

- මෙම අවස්ථාවේ දී පෙ.ව. 09.50 ට ගරු මන්ත්‍රී බී. සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා ගරු සභාවට පැමිණෙන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ මෙම වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘතියක් බවත්, මෙම මර්ගය සභාව සතු වන බැවින් ඒ සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා තිබෙන බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.3.2. ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ 2026 වර්ෂය සඳහා ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත සභාව සතු පහත මාර්ග සඳහා එකඟතාවය ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

| අනු අංකය | ග්‍රාම නිලධාරී වසම | මාර්ගයේ නම | සංවර්ධනය කළ යුතු දුර | පළල | සංවර්ධනය කළ යුතු ක්‍රමවේදය | ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව | ඇස්තමේන්තු මුදල (රු.) |
|---|---|---|---|---|---|---|---|
| 01 | සිංහරූපාගම | ශ්‍රී නිවේසාරාම මාර්ගය සංවර්ධනය කිරීම | 170 m | 3 m | කොන්ක්‍රීට් | 1000 | 3,500,000.00 |
| 02 | හිපන්වත්ත | සිල්වර් පොයින්ට් මැදපාර සහ දියපරදුව ප්‍රධාන මාර්ගයට සම්බන්ධ වන අතුරු මාර්ගය සංවර්ධනය කිරීම | 123 m | 4.2 m | කොන්ක්‍රීට් | 50 | 3,872,000.00 |
| 03 | ගලගම | බණ්ඩාරනායක මාවතේ මැද වෙල්ල පාර සංවර්ධනය කිරීම | 130 m | 3.6 m | කොන්ක්‍රීට් | 1000 | 4,000,000.00 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 04 | තුන්දුව නැගෙනහිර | හොරවලවත්ත පාර (වාමිනී ප්‍රනාන්දු මහත්මියගේ නිවස අසල සිට නජීප් මහතාගේ නිවස අසල දක්වා මාර්ගය) ප්‍රතිසංසකරණය කිරීම | 101 m | 2.7 m | කොන්ක්‍රීට් | 46 | 1,328,000.00 |
| 05 | පිලේකුඹුර | මහ පිලේකුඹුර මාර්ගයේ පළමු අතුරු මාර්ගය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම | 100 m | 2.5 m | කොන්ක්‍රීට් | 6 | 1,300,000.00 |

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.3.3. සභාපති, ලේකම් නිල කාමර සහිත කාර්යාල පරිශ්‍රය තුළ දිවා කාලයේ දී පවතින අධික රස්නය හේතුවෙන් එහි රැඳී සිටීම මෙන්ම රාජකාරී කිරීමේ දී දැඩි අපහසුතාවයක් ද පවතී. එබැවින් එම පරිශ්‍රයේ වායු සමීකරණ යන්ත්‍ර පද්ධතියක් සහ පිටාර විදුලි පංකා (exhanst fans) සවි කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
නිලධාරීන් රැඳී සිටින පරිශ්‍රයේ දැඩි රස්නයක් පවතින නමුත් එහි පිහිටීම මත වායු සමීකරණය කිරීම පිළිබඳ ප්‍රායෝගික ගැටලුවක් පවතින බවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පැත්තෙන් පිහිටා ඇති පැති බිත්තියේ ජනෙල් සවි කිරීමේ හැකියාවක් ද නොමැති බවත්, ඒ අනුව තාක්ෂණ සේවා නිලධාරී මහතා සමඟ සාකච්ඡා කොට එම පැති බිත්තියේ පිහිටා ඇති කවුළු 8 න් 4 ක් ගලවා එම ස්ථානවල පිටාර විදුලි පංකා (exhanst fan) 04 ක් සවි කිරිමට කටයුතු කරන බවත්, එමඟින් තරමක් දුරට හෝ පවතින රස්නය අඩුවේ යැයි බලාපොරොත්තු වන බවත් මෙහි දී සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.3.4. ඉන්ධන, ගෑස්, විදුලි බලය ආදී වූ බලශක්ති මිල ගණන් ඉතා සීඝ්‍රයෙන් ඉහළ යාම නිසා ප්‍රාදේශීය සභාව මඟින් මුදල් අයකර ලබා දෙන විවිධ සේවාවලින් අය කරනු ලබන ගාස්තු යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවය මතුව ඇත. එම ගාස්තු වසර කිහිපයකින් යාවත්කාලීන කර නොමැති බැවින් 2026.04.07 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ දී එකී ගාස්තු මැයි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය

කිරීමට නිර්දේශ විය. ඒ අනුව එම ගාස්තු පහත පරිදි සංශෝධනය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

| අනු අංකය | ගාස්තු වර්ගය | පැවති ගාස්තුව | සංශෝධිත ගාස්තුව |
|---|---|---|---|
| 01 | 6000 L වතුර බවුසරය එක් වාරයකට | රු. 8,000.00 | රු. 10,000.00 |
| 02 | 3000 L වතුර බවුසරය එක් වාරයකට | රු. 4,000.00 | රු. 6,000.00 |
| 03 | 5000 L වතුර බවුසරය එක් වාරයකට | රු. 7,000.00 | රු. 9,000.00 |
| 04 | 4000 L වතුර බවුසරය එක් වාරයකට | රු. 5,500.00 | රු. 7,000.00 |
| 05 | 2000 L වතුර බවුසරය එක් වාරයකට | රු. 3,000.00 | රු. 4,000.00 |
| 06 | 1000 L වතුර බවුසරය එක් වාරයකට | රු. 1,500.00 | රු. 2,000.00 |
| 07 | ජල ටැංකිය සමඟ ආධාරකය ලබා දීමට දිනකට | රු. 300.00 | රු. 500.00 |
| 08 | වේලර් බවුසරය සමඟ ජලය ලබා දීමට දිනකට | රු. 1,000.00 | රු. 2,000.00 |
| 09 | බල ප්‍රදේශ තුළ ගලි බවුසරය එක් වාරයකට | රු. 11,500.00 | රු. 13,500.00 |
| 10 | බල ප්‍රදේශයෙන් බැහරව ගලි බවුසරය එක් වාරයකට | රු. 13,500.00 | රු. 17,500.00 |
| 11 | ඩ්‍රම් ට්‍රක් රථය දිනකට පැය 8 කට රියදුරු ඉන්ධන සහිතව | රු. 15,000.00 | රු. 20,000.00 |
| 12 | බැකෝ යන්ත්‍රය (මීටර් පැයකට) | රු. 5,500.00 | රු. 6,000.00 |
| 13 | ආදාහනාගාරය (බල ප්‍රදේශය තුළ) | රු. 8,000.00 | රු. 11,000.00 |
| 14 | ආදාහනාගාරය (බල ප්‍රදේශයෙන් පිට) | රු. 13,000.00 | රු. 15,000.00 |

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

රටේ මේ වන විට පවතින තත්ත්වය හමුවේ ඉන්ධන විදුලිය ගෑස් ඇතුළු බලශක්තිය නිපදවන සියලුම දේවල මිල ඉහළ ගොස් ඇති බවත්, මේ නිසා අප ආයතනය වෙතින් සපයනු ලබන සේවාවන් සඳහා අය කරන ගාස්තු ද ඉහළ දැමීමට සිදු ව ඇති බවත්, අප සභාවට ආසන්න අනෙකුත් ප්‍රාදේශීය සභාවලින් ආදාහනයක් සිදු කිරීම සඳහා අය කරනු ලබන ගාස්තු සලකා බැලූ විට මෙම මිල ඉහල යාමට පෙර සිටම අප අය කරනු ලබන ගාස්තුවට වඩා වැඩි මුදලක් අය කරනු ලැබූ බවත්, අප මෙම මිල ඉහළ දැමීම සිදු කළ ද සභාවට මෙයින් ආදායමක් නොලැබෙන බවත්, වැයවන පිරිවැය පියවා ගැනීමට පවා මෙම ගාස්තුව ප්‍රමාණවත් නොවන බවත්, ජනතාවට සේවය සැපයීම මූලික අරමුණ කොටගෙන මෙලෙස කටයුතු කරන බවත්, ගලි බවුසර් සේවාව සැලකූ විට මෙම නව මිල ගණනම පෞද්ගලික අංශයේ ද ගලි බවුසර් සඳහා අය කරන බැවින් මෙම මුදල තව දුරටත් ඉහළ දැමිය නොහැකි බවත්, මෙම අය කරනු ලබන මුදලින් කොටසක් සංචාරක මණ්ඩලයට ගෙවිය යුතු බවත්, මේ පිළිබඳ මන්ත්‍රීතුමන්ලාගේ අදහස් බලාපොරොත්තු වන බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා</u>

පවතින ආර්ථික වටපිටාව තුළ ගාස්තු සංශෝධනය කළ යුතු වුවත් ආදාහනාගාර ගාස්තු සංශෝධනය කිරීම පිළිබඳ නැවත සිතා බලන ලෙසත්, ඊට හේතුව ලෙස බෙන්තර බල ප්‍රදේශය තුළ මෙම මිල වැඩිවීම දරාගත හැකි ජනතාව මෙන්ම නොහැකි ජනතාව ද සිටින බැවින් මෙය තවදුරටත් සභාවෙන් සිදු කරනු ලබන ගෞරවනීය සේවාවක් සේ සලකා මානුෂීයව නැවත වරක් සිතා බලන ලෙස සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>
බල ප්‍රදේශයෙන් පිට සිදු කරනු ලබන ආදාහන සඳහා පමණක් ගාස්තු වැඩි කිරීම සුදුසු බව සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා</u>
ආසන්න ප්‍රාදේශීය සභාව ද බල ප්‍රදේශය තුළ මේ වන විටත් රු. 12,500/- ක් අය කරනු ලබන බැවින් මෙම ආර්ථික තත්ත්වය හමුවේ අප ද එම ගණන් අය කිරීම සුදුසු බව සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
සභාවෙන් සිදු කරනු ලබන සේවාවක් සේ සලකා බල ප්‍රදේශයේ ආදාහනයක් සඳහා රු. 11,000/- ක මුදලක් ද බල ප්‍රදේශයෙන් පිට ආදාහනයක් සඳහා රු. 15,000/- ක මුදලක් ද අය කිරීම සුදුසු බව සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.3.5. දකුණු පළාත් සංවර්ධන සැලැස්ම 2026, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - පූර්ව ළමාවිය සංවර්ධනය, පෙර පාසල් දරුවන් සඳහා සෞඛ්‍ය සහ පෝෂණ වැඩසටහන් යටතේ අනුමත වී ඇති රු.120,000/- ක මුදලින් බෙන්තොට ප්‍රාදේශීය සභා පෙර පාසල් 06 හි දරු දැරියන්ට යෝගට් 01 බැගින් මාස 02 ක් ලබා දීමටත්, ඒ සඳහා වැයවන මුදල් සභා අරමුදලින් දරා පසුව එම මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
පෙර පාසල් 06 හි දරු දැරියන් 100 ත් 110 ත් අතර ප්‍රමාණයක් සිටින බවත්, ඉදිරි මාස 02 සඳහා එම දරුවන්ගේ පෝෂණ අවශ්‍යතා ලෙස රු. 120,000/- ක මුදලක් පළාත් නිශ්චිත යටතේ වෙන් කර ඇති බවත්, මෙම මුදලින් දරුවන් හට ලබා දීමට හැකි වන්නේ සුළු දෙයක් වන බැවින් පෙර පාසල් ගුරුවරුන්ගේ ඉල්ලීම පරිදි යෝගට් 01 බැගින් ලබා දීමට තීරණය කළ බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.3.6. බෙන්තොට දෝපේ වේරගොඩවත්ත පාරේ ඉතිරි මීටර් 30 ක පමණ ප්‍රමාණය ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.3.7. බෙන්තොට දෝපේ තන්තිරිගෙවත්ත හරස් පාරේ ඉතිරි මීටර් 30 ක පමණ ප්‍රමාණය ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

5.3.8. අප සභාව මඟින් පිහිටුවන ලද ලියාපදිංචි ප්‍රජා මණ්ඩල සංවිධානයක් වන හබුරුගල එක්සත් ප්‍රජා මණ්ඩලය විසින් 2026.05.05 වන දින පැවැත්වීමට නියමිත සෞඛ්‍ය කඳවුරෙහි සංග්‍රහ කටයුතු වෙනුවෙන් සමිති ගිණුමෙන් රු. 30,000/- ක මුදලක් ලබා ගැනීමට කරන ලද ඉල්ලීම සඳහා සභාවේ අවසරය ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
මෙම ප්‍රජා මූල මණ්ඩලය සභාව මඟින් පිහිටුවා ඇති බවත්, ඒ හේතුවෙන් එම සමිතිය සතු ගිණුමෙන් මුදල් ලබා ගැනීම සඳහා සභාවේ අවසරය ලබා දිය යුතු වන බවත්, ඒ වෙනුවෙන් මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.3.9. බෙන්තොට ප්‍රාදේශීය සභාව සමඟ එක්ව රුධිරය පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් පැවැත්වීමට ප්‍රදේශයේ සමාජ සේවක මහතෙකු ඉදිරිපත් වී සිටී. ඔහු වැඩසටහනේ මූලික වියදම් බොහොමයක් දැරීමට එකඟව ඇති බැවින් එම රුධිර පරිත්‍යාග කිරීමේ වැඩසටහන බෙන්තොට ප්‍රාදේශීය සභා පරිශ්‍රයේ පැවැත්වීම සුදුසු බවටත් රුධිර පරිත්‍යාගශීලීන්ට සංග්‍රහ කටයුතු සිදු කිරීම වෙනුවෙන් සභා අරමුදලින් රු. 20,000/- ක වැය බරක් දැරීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 5.4. <u>ගරු මන්ත්‍රිනී, මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-</u>

5.4.1. මහ ඉඳුරුව සුදුවැලිපොත මාර්ගයේ ගුරුකන්ද ගොඩැල්ල මාවතට පිවිසෙන මාර්ගයේ ජලය බැස යාමට යොදා ඇති කාණු පද්ධතිය අබලන් වී ඇති හෙයින් එම කොටස ප්‍රතිසංස්කරණය කර දෙන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රිනී, මධුභාෂිකා දිල්හානි මැතිතුමිය</u>
මින් පෙර කොන්ක්‍රීට් ලැලි යොදා සකස් කරන ලද කාණුව මේ වන විට ගිලා බැස ඇති බවත්, මේ වන විට ඒ හරහා ගමන් කළ හැකිව පවතින්නේ පා පැදි හා යතුරු පැදිවලට පමණක් වන බවත් මේ නිසා එම බෝක්කු කොටස සකස් කර දෙන ලෙසත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.4.2. උඩුමුල්ල, ඉහළවත්ත මාවතෙහි "ජයසේන" මහතාගේ නිවස ළඟ සිට අඩි 68 ක් පමණ ඉදිරියට පැති කාණුව සකස් කර දෙන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රිනී, මධුභාෂිකා දිල්හානි මැතිතුමිය</u>
මෙම ඉහළ මාවතෙහි ජලය පාරට ගලා ගන බවත් මේ හේතුවෙන් පැති කාණුවක් සකස් කර දෙන ලෙසත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.4.3. බෝගහවත්ත, කන්දෙමුල්ලට පිවිසෙන මාර්ගය අබලන් වී ඇති හෙයින් එම මාර්ගය නැවත ප්‍රතිසංස්කරණය කර දෙන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රිනී, මධුභාෂිකා දිල්හානි මැතිතුමිය</u>
එම මාර්ගයේ අඩි 40 ක පමණ ප්‍රමාණයක තාර තට්ටුව ගැල වී ගොස් ඇති බවත්, මේ වන විට පුද්ගලයන් දෙදෙනෙකු පමණ මෙම වලවල්වල වැටී ඇති බවත්, මෙම මාර්ගය නැවත ප්‍රතිසංස්කරණය කර දෙන ලෙසත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.5. <u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-</u>**

5.5.1. හබුරුගල, මහගොඩ කොට්ඨාසයේ හොරවල හා ඉත්තැපාන අතර පවත්වාගෙන යනු ලබන පාලම් පාරුව මඟින් ලැබෙන ආදායම මාස 06 කට වරක් බෙන්තොට ප්‍රාදේශීය සභාවට ලබා ගැනීමට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>

මෙම පාලම් පාරුවට බෙන්තරින් අයත් වන කොටස සහා අරමුදල් මඟින් ප්‍රතිසංස්කරණය කර මාර්ගය හොඳින් සකස් කර තිබුණ ද මෙහි සම්පූර්ණ ආදායම ලබා ගන්නේ වලල්ලාවිට ප්‍රාදේශීය සභාව වන බවත්, නමුදු වලල්ලාවිට සභාවට අයත් කොටසේ මාර්ග ඉතාම අබලන් තත්ත්වයෙන් පවතින බවත්, කිසිදු නඩත්තුවක් සිදු නොකරන බවත්, මින් පෙර එම සභාවට එහි ආදායම ලැබී ඇත්තේ මාස 06 කට වතාවක් වන බවත්, අප සභාවට ආදායමක් ලබා ගැනීමේ අරමුණින් මාස 06 ක කාලයක් සඳහා අප සභාවට ලබා දෙන මෙන් ඉල්ලීමක් සිදු කිරීම සුදුසු බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, නිස්සංක දේශප්‍රිය මැතිතුමා</u>

මේ වන විට වලල්ලාවිට සභාව මෙයින් පාඩු ලබන බවත්, තොටියන් 04 දෙනෙකුට වැටුප් ගෙවීමට සිදු ව ඇති බවත්, මෙවර ටෙන්ඩර් කළ ද ඒ සඳහා කිසිවෙක් ඉදිරිපත් වි නොමැති බවත් සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

මෙතෙක් කල් පාලම් පාරුවේ පූර්ණ ආදායම වලල්ලාවිට ප්‍රාදේශීය සභාව ලබා ගත් බවත්, නමුත් නීත්‍යානුකූලව බැලූ විට එක් මායිමක් අප සභාවට අයත් වන බැවින් ද එහි නඩත්තු කටයුතු අප සභාව මඟින් සිදු කරනු ලබන බැවින් ද අප සභාවට ද එහි ආදායම ලබා ගැනීමේ අයිතියක් පවතින බවත්, මේ නිසා සභාවේ ඒකමතික යෝජනාවක් ලෙස වලල්ලාවිට ප්‍රාදේශීය සභාවට ලිඛිතව මේ පිළිබඳ ඉල්ලීමක් සිදු කිරීම සුදුසු බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.5.2. හබුරුගල දෙද්දුව බොල්ගොඩ රවුම් පාර දෙපස එළිපෙහෙළි කිරීමට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>

මෙම මාර්ගය ජෙෆ්රි බාවා උද්‍යානයට ගමන් කරන මාර්ගය වන බවත්, සංචාරකයන් බහුලව මෙම මාර්ගය භාවිත කරන බවත්, මේ වන විට යතුරු පැදියකින්වත් ගමන් කළ නොහැකි තත්ත්වයට මෙම මාර්ගය පත්ව ඇති බවත්, පසුගිය වර්ෂයේ මධ්‍යම රජය යටතේ හෝ ප්‍රතිසංස්කරණය වේයැයි බලාපොරොත්තු වුවත් එය ඉටු නොවූ බවත්, මේ වන විට මාර්ගය දෙපස කැළය වැවී ගස්වල අතු පාරට බරව පවතින බවත්, සභා අරමුදල් මඟින් මෙම මාර්ගය පිළිසකර කිරීමට කටයුතු කිරීම සුදුසු බවත් සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

නිවාස කොපමණ ප්‍රමාණයක් සඳහා ගමන් කිරීමට මෙම මාර්ගය යොදා ගන්නේදැයි පිළිබඳ මෙහි දී විමසන ලදී.

<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>
නිවාස 100 කට අධික ප්‍රමාණයක් සඳහා මෙම මාර්ගය භාවිත කරන බවට සභාව දැනුවත් කරන ලදී.

- මෙම අවස්ථාවේ දී මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් පෙ.ව. 10.30 ට මහ සභාව කාරක සභාවක් බවට පත් විය.

<u>කාරක සභා අවස්ථාව</u>

<u>ආදායම් පරීක්ෂක, බී. එන්. ඩී. උපාලි මහතා</u>
මෙය සාංචාරක මණ්ඩලයේ අනුමත හෝටලයක් වන බවත්, 0.5% ක බදු මුදලක් සභාව වෙත ගෙවන බවත්, වාර්ෂිකව මේ හරහා ලක්ෂ 7ක 8 ක ආදායමක් ලබා ගන්නා බවත් මෙහි දී පැහැදිලි කරන ලදී.

<u>තාක්ෂණ සේවා නිලධාරී, එම්. ඒ. එස්. ජයසිංහ මහතා</u>
මෙම මාර්ගය බාවා උද්‍යානයෙන් අවසන් නොවන බවත්, මෙම වටරවුම් පාර නැවත පරගහතොට හංදියට එකතු වන බවත්, මේ නිසා සම්පූර්ණ ගම්මානයක් වටවන මාර්ගයක් වන බවත්, නිවාස අධික ප්‍රමාණයක් පවතින බවත් පැහැදිලි කරන ලදී.

- මෙම අවස්ථාවේ දී කාරක සභාව නැවත මහ සභාව බවට පත් කිරීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් පෙ.ව. 10.35 ට කාරක සභාව නැවත මහ සභාව බවට පත් විය.

<u>මහ සභාව</u>

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
පාර දෙපස වැවී ඇති අතු ඉවත් කිරීමට කටයුතු කරන බවත්, තාර දැමීම සඳහා ප්‍රමාණවත් තරම් සභා අරමුදල් නොමැති බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිනව සභා සම්මත විය.

5.5.3. හබුරුගල සූරියගම වසමේ ඇති හබුරුගල පොදු සුසාන භූමියේ මායිම් දක්වා එළිපෙහෙළි කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිහාල් මැදගොඩ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>
මෙහි මායිම් පිටස්තර පුද්ගලයන් අල්ලා ගනිමින් පවතින බවත්, අක්කර 4 ක පමණ භූමි ප්‍රමාණයක් මෙම ඉඩමට තිබෙන බවත්, දැනට අප භාවිත කරනු ලබන්නේ පර්චස් 60 කට අඩු භූමි ප්‍රමාණයක් වන බවත්,

මෙහි මායිම් කොටස් පමණක් හෝ JCB යන්ත්‍රය යොදා එළිපෙහෙළි කර මායිම් ලකුණු කිරීමට හැකි නම් සුදුසු බවත් සඳහන් කරන ලදී.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**

මෙම සුසාන භූමිය මෙන්ම සභාව සතු ගල්තුඩුව සුසාන භූමිය, වරාහේන සුසාන භූමිය ආදිය ද පිටස්තර පුද්ගලයින් විසින් අල්ලාගෙන පවතින බවත්, මෙම ඉඩම්වල මායිම් ලකුණු කිරීමේ කටයුතු සිදු කිරීම සුදුසු බවත් සඳහන් කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී, ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා</u>**

මෙම සුසාන භූමි ගැටලුව බරපතල වන බවත්, මහවිල වරාහේන ආදී සුසාන භූමිවල මායිම් ගැටලු නිරාකරණය කර ගැනීම සුදුසු වන බවත්, ගලගම සුසාන භූමියේ සොහොන් විශාල ප්‍රමාණයක් කොන්ක්‍රීට් කර ඇති බවත් තව දුරටත් කොන්ක්‍රීට් කිරීමට එහි ඉඩකඩ නොමැති බවත්, වෙසක් පොහොය දිනය වන විට පැරණි සොහොන් කොත් පවා අලුතින් කොන්ක්‍රීට් කරන බවත්, මේ සඳහා යම් වැඩපිළිවෙළක් සකස් කිරීම සුදුසු බවත් සඳහන් කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී, මිගාර වලල්ලාවිට මැතිතුමා</u>**

ඔලගන්දුව සුසාන භූමිය පහුගිය දිනවල මැනීම් කටයුතු සිදු කළ නමුත් මෙතෙක් එහි මායිම් කිසිවක් ලකුණු කර නොමැති බවත්, වරාහේන සුසාන භූමියේ කොටසක් අසල පවතින අවන්හල විසින් මේ වන විට වාහන නැවැත්වීමට ද යොදාගෙන ඇති බවත් සඳහන් කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී, නිශාන්ත කුමාර මැතිතුමා</u>**

දැනට බොහොමයක් සුසාන භූමිවල පිළිවෙළක් නොමැතිව තැනින් තැන සොහොන් කොන්ක්‍රීට් කර ඇති බවත්, මේ නිසා කොන්ක්‍රීට් කරන ලද සොහොන් බහුලව පවතින ප්‍රදේශයක් සලකා එම ප්‍රදේශය කොන්ක්‍රීට් කරන සොහොන් සඳහා ලබා දීම සුදුසු වන බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.6. <u>ගරු මන්ත්‍රී, උඩබේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-</u>**

5.6.1. දෝපේ කොට්ඨාසයේ කහගල්ල ග්‍රාම නිලධාරී වසමේ අඩගංතොට හුංගංතොට දක්වා දිවෙන කොන්ක්‍රීට් පාරේ, ඇල්පිටිය පාරේ සිට මීටර් 75 ක් පමණ ගිය විට පාරේ කොන්ක්‍රීට් කොටසක් කැඩී වලක් ලෙස පවතී. මේ නිසා මෙම ස්ථානයෙන් ගමන් කරන වාහනවලට දැඩි අලාභහානි සිදුවන අතර මෙය ප්‍රතිසංස්කරණය කරදෙන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ප්‍රනාන්දු මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.7. <u>ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-</u>**

5.7.1. බෙන්තොට කෝම්මල - ආරච්චිමුල්ල පාරේ සිට ආරච්චිමුල්ල පළමු හරස් මාර්ගය (උස්වත්ත පාර) කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කර දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා</u>
මෙම මාර්ගයේ මේ වන විට නිවාස විශාල ප්‍රමාණයක් ඉදි කෙරෙමින් පවතින බවත්, ලැබෙන ප්‍රතිපාදන අනුව ටික ටික හෝ මෙම මාර්ගය සකස් කිරීම සුදුසු බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.7.2. ආරච්චිමුල්ල - කෝම්මල පාරේ සිට රන්දිදු පෙර පාසල අසලින් දිවෙන හරස් පාරේ කෙළවර මීටර් 25 ක පමණ කොටස සභාවේ බැකෝ යන්ත්‍රය යොදවා කැළෑව එළිකර පස් පුරවා සංවර්ධනය කර සෝනුත්තර මාවතේ සිට ඇති හරස් පාරට සම්බන්ධ කර දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.7.3. මැයි මාසයේ සිට බැකෝ යන්ත්‍රය, කම්කරුවන් සහ විදුලි පහන් සවි කිරීම සඳහා කොට්ඨාස 13 ම නියෝජනය වන පරිදි ක්‍රමවත් සැලැස්මක් සකසා කලින් ලබා දීමට කටයුතු කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.8. <u>ගරු මන්ත්‍රී, නිලුපුල් සම්පත් මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා:-</u>**

5.8.1. තොටකනත්ත වසමේ මාගල දක්වා දිවෙන මාර්ගයේ දෙපස කාණු පද්ධතිය වතුර බැස යන ලෙස පිළිසකර කර දෙන ලෙස යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී පුණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු මන්ත්‍රී, නිලුපුල් සම්පත් මැතිතුමා**</u>
ඊයේ දිනයේ අධික වර්ෂාවක් එම ප්‍රදේශයට ඇද හැලුණු බවත්, එම මාර්ගයේ කාණු පද්ධතිය පිරිසිදු කර වතුර ගලා යාමට හැකිවන ලෙස සකස් කර දෙන ලෙස ප්‍රදේශවාසීන් විසින් ඉල්ලීමක් සිදු කළ බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.8.2. හබුරුගල ධර්මරාජ විද්‍යාලය ඉදිරිපිට මාර්ගයේ පාසල් ළමුන්ගේ ආරක්ෂාව සඳහා පාසල් මායිම දෙපස වේග පාලන බාධක යෙදීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී පුණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු මන්ත්‍රී, නිලුපුල් සම්පත් මැතිතුමා**</u>
පාසල් සංවර්ධන සමිතිය මඟින් මෙම ඉල්ලීම සිදු කළ බවත්, ප්‍රාථමික පාසලක් වන බැවින් ළමුන් පාසලට ඇතුල් වන විට හා පාසලෙන් පිටවන විට බොහෝ විට මෙම ස්ථානයෙන් අධික වේගයෙන් ත්‍රීවිල් හා යතුරු පැදි ගමන් කරන බවත්, ළමුන්ගේ ආරක්ෂාව සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කරන බවත් සඳහන් කරන ලදී.

<u>**ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා**</u>
මෙය කාලෝචිත යෝජනාවක් වන බවත්, බොහෝ වෙලාවට පාසල් ළමුන් මෙම මාර්ගය භාවිත කරන බවත්, ළමුන්ගේ ආරක්ෂාව සඳහා මෙය ඉටු කිරීම සුදුසු බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.8.3. අප ප්‍රාදේශීය සභාවට අයත් හබුරුගල ක්‍රීඩා පිටියට පිටතින් ජලය ගලා ඒම වැළැක්වීමට කටයුතු කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිශාන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා**</u>
මාර්ගයේ ගලා යන ජලය අප සභාවට අයත් පිට්ටනියට එකතු වන බවත්, මේ නිසා කුඩා වර්ෂා තත්ත්වයක දී වුව ද එම පිට්ටනිය භාවිත කල නොහැකි තත්ත්වයට පත්වන බවත්, එම වතුර පාර, පාර දිගේ ගලා යන ලෙස බැම්ම සකස් කර දීම ද සුදුසු බව සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.9. <u>ගරු මන්ත්‍රී, ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-</u>**

5.9.1. සිංහරුපාගම ශ්‍රේස්විලා සහ තවත් නිවාස රසකට යන මාර්ගයේ ඇති බෝක්කුව කැඩී ඇති බැවින් එය පිළිසකර කර දීම සුදුසු බවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.10. <u>ගරු මන්ත්‍රී, තාරක විජේකෝන් මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-</u>**

5.10.1. සභාවේ කටයුතු වෙනුවෙන් ලීටර් 5000 වතුර ටැංකියක් මිල දී ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, තාරක විජේකෝන් මැතිතුමා</u>
පැවති නියං කාලගුණික තත්ත්වය හමුවේ හැකිතාක් දුරට මුළු බෙන්තර බල ප්‍රදේශයටම ජලය ලබා දීමේ කටයුතු සිදු කිරීම වෙනුවෙන් මේ මොහොතේ පළමුව ගරු සභාපතිතුමා ලේකම්තුමා ඇතුළු ජල බවුසරයේ සේවක මහතුන්ට ස්තූතිවන්ත වන බවත්, අවසාන දවස් කීපය වන විට බවුසරය අලුත්වැඩියා කිරීමට සිදු වූ බැවින් දැඩි අපහසුතාවයකට පත් වීමට සිදු වූ බවත්, තවත් ලීටර 5,000 වතුර ටැංකියක් අප සතුව පැවතියේ නම් මෙවැනි හදිසි අවස්ථාවල ට්‍රැක්ටර් රථය මඟින් ජලය ලබා දීමේ හැකියාව පවතින බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.10.2. ප්‍රාදේශීය සභාවට ජලය සපයා ගැනීම සඳහා අමතර ළිඳක් සකසා ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී තිලක් උපුල් වමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, තාරක විජේකෝන් මැතිතුමා</u>
පසුගිය නියං කාලයේ දී සභාව සතු ළිඳ සිඳී ගිය බවත්, මේ නිසා දැඩි අපහසුතාවයකට පත් වූ බවත්, ජලය හොඳින් පවතින ප්‍රදේශයක සභාව සතුව අමතර ළිඳක් තිබේ නම් මෙවැනි අවස්ථාවල දී ජලය ලබා ගැනීමට භාවිත කළ හැකි බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.10.3. දැනට භාවිත නොකරන ට්‍රැක්ටර් ජල බවුසරය කඩිනමින් අලුත්වැඩියා කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, තාරක විජේකෝන් මැතිතුමා</u>
මෙය අලුත්වැඩියා කර නිසි කළමනාකරණයක් සිදු කළහොත් මේ මඟින් සභාවට සැලකිය හැකි ආදායමක් ලබා ගත හැකි බව සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
පසුගිය දිනවල ජලය නොමැති ප්‍රදේශ සඳහා ජලය ලබා දීමේ කටයුතු සිදු කළ බවත්, මෙම අවස්ථාවේ ජලය ලබා දීමට තවත් අය ඉදිරිපත් වුවත් එම ජලයෙහි ප්‍රමිතිය පිළිබඳ වග කිව හැකි තත්ත්වයක් නොමැති බැවින් එම ජලය ලබා දීමට නොහැකි වූ බවත්, දවසකට ජලය ලබා ගැනීම සඳහා එන ඉල්ලීම් ප්‍රමාණය ලීටර් 12,000 ක් පමණ වන බවත්, නමුත් දිනකට ලබා දිය හැකි වන්නේ ලීටර් 6,000 ක් පමණ වන බවත්, කෙසේ හෝ සභාවක් ලෙස අපට කළ හැකි උපරිමය සිදු කළ බවත්, අප සතු ජල ටැංකිවලට අමතරව උපාලි සිරිමාන්න මහතා සමඟ සම්බන්ධ වී රතු කුරුස සංවිධානයෙන් ද ටැංකි 04 ක් ලබා ගත් බවත්, ඒ වගේම තමන්ගෙ පෞද්ගලික වාහනය යොදා ගනිමින් පන්සල් පාසල්වලට ජලය ලබා දීමට කටයුතු කිරීම පිළිබඳව මේ අවස්ථාවේ තාරක මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වන බවත්, ඒ වගේම කොඩිතුවක්කු මන්ත්‍රීතුමා ද ලීටර 12,000 වතුර ටැංකියක් සහිත බවුසරයක් යොදා ගනිමින් ජලය ලබා දීමේ කටයුතු සිදු කිරීම පිළිබඳ ස්තුතිවන්ත වන බවත්, පසුගිය දිනවල ජල සම්පාදන මණ්ඩලයේ ජල බවුසරය ද අක්‍රීය වීම නිසා එම ආයතනයට ද අප විසින් ජලය ලබා දුන් බවත්, ජල ගැටලුව සභාවට අයිති නොවුණ ද හැකි ලෙස ජනතාවට ජලය ලබා දීමට කටයුතු සිදු කරන බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.11. <u>ගරු මන්ත්‍රිනී, ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-</u>**

5.11.1. බෙන්තොට සිංහරුපාගම සුසාන භූමියේ ළිඳට පිවිසීමට හැකිවන පරිදි සකසා දීම සහ සුසානභූමිය කැළය කපා පිරිසිදු කරදෙන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රිනී, ලෙනිකා දූෂන්ති මැතිතුමිය</u>
ප්‍රදේශවාසීන් විසින් ජලය ලබා ගත හැකි ස්ථානයක් නොමැති බැවින් සුසාන භූමියේ සිලින්ඩර් කීපයක් බස්සවා ළිඳක් සකස් කරගෙන පවතින බවත්, දැල් ගසා මායිම් ආවරණය කර ඇති නිසා මේ වන විට එම ළිඳ පරිහරණය කිරීමට නොහැකිව පවතින බවත්, මායිම් වෙන් කළ පසු එහි කිසිදු එළිපෙහෙළි කිරීමක් සිදු

කර නොමැති බවත්, මේ නිසා කැළය වැවී ඇති බැවින් අනෙක් පසින් හෝ ළිඳ වෙත ළඟා වීමට නොහැකි බවත්, මෘත දේහ තැන්පත් කිරීමේ දී මුදල් ගෙවනු ලබන එකම සුසාන භූමිය ද මෙය වන නිසා සභාවේ කම්කරු මහතුන් යොදා එළඹෙන මැයි මස 16 වන දින එය එළිපෙහෙළි කර දීමට කටයුතු කරන ලෙසත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, ඉන්දික සේරසිංහ මැතිතුමා</u>
පසුගිය දින කීපයක රාත්‍රී කාලයේ එම ස්ථානයෙන් ගමන් කිරීමේ දී ප්‍රදේශවාසීන් විසින් විදුලි පන්දම් ආලෝකයෙන් කැළය පීරමින් සිටි බවත්, ඒ පිළිබඳ විමසූ විට විවිධ අපචාර සිදු කරන පුද්ගලයන් මෙම මෙම කැලය තුළ සැඟවී සිටින බව පැවසූ බවත්, මේ හේතුවෙන් එම කැළය එළිපෙහෙළි කිරීම සුදුසු වන බවත් සඳහන් කරන ලදි.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**6. කාරක සභාවල වාර්තා සලකා බැලීම :-**

6.1. 2026.02.23 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

2026.02.23 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

6.2. 2026.03.09 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

2026.03.09 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

6.3. 2026.03.09 දින පැවති කාර්මික සේවා හා කමිටු රැස්වීම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

2026.03.09 දින පැවති කාර්මික සේවා හා කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

6.4. 2026.02.13 දින පැවති කාර්මික සේවා හා කමිටු රැස්වීම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

මෙම කමිටු වාර්තාව න්‍යාය පත්‍රයේ 2026.03.13 ලෙස සටහන් වී තිබූ බවත්, එය 2026.02.13 ලෙස සංශෝධනය විය යුතු බවත් සඳහන් කරන ලදී.

2026.02.13 දින පැවති කාර්මික හා සේවා කමිටු රැස්වීම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රී තිලක් උපුල් චමින්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

6.5. 2026.03.16 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු රැස්වීම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

2026.03.16 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු රැස්වීම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රී තිලක් උපුල් චමින්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

6.6. 2026.03.16 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

2026.03.16 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී ලෙනිකා දුෂන්ති මැතිතුමිය විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

6.7. 2026.03.23 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

2026.03.23 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රී තිලක් උපුල් චමින්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**7. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ වාර්තා සහ වෙනත් ලේඛන සභාවට ඉදිරිපත් කිරීම හා සලකා බැලීම :-**

**7.1. <u>2026 මාර්තු මස ලැබීම් හා වියදම් වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.</u>**

2026 මාර්තු මස ලැබීම් හා වියදම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් සභා ගත කරන ලදී.

| 2026 මාර්තු මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය | |
|---|---|
| පුනරාවර්තන ආදායම් එකතුව | රු. 8,598,074.69 |
| එකතු කළා මූලධන ලැබීම් :- | - |
| පුනරාවර්තන හා මූලධන ලැබීම්වල එකතුව | **රු. 8,598,074.69** |

| | |
|---|---|
| සේවක ණය | රු. 350,339.71 |
| තැන්පත් | රු. 398,273.29 |
| දේපළ ණය පොළී | රු. 10,511.51 |
| සාමාන්‍ය අත්තිකාරම් | රු. 58,290.00 |
| බලපත්‍ර බදු | රු. 2,675.00 |
| වැටුප් හා වවුචර් මුද්දර බදු | රු. 3,525.00 |
| UDA සේවා ගාස්තු තැන්පත් | රු. 48,835.00 |
| 101 ට බැර | රු. 34,518.50 |
| 201 ට බැර | රු. 76,457.63 |
| 301 ට බැර | රු. 90,640.78 |
| 601 ට බැර | රු. 17,643.56 |
| 105 ට බැර | රු. 20.00 |
| එකතුව | **රු. 9,689,804.67** |
| 2026 මාර්තු මස ඒකාබද්ධ වැය සාරාංශය | |
| පුනරාවර්තන වියදම් එකතුව | රු. 13,457,124.50 |
| එකතු කළා -ප්‍රාග්ධන වියදම් | රු. 931,466.33 |
| පුනරාවර්තන හා ප්‍රාග්ධන වැයවල එකතුව | **රු. 14,385,590.83** |
| දේපළ ණය පොළී | රු. 10,511.51 |
| තැන්පත් | රු. 209,769.44 |
| සාමාන්‍ය අත්තිකාරම් | රු. 36,040.00 |
| සේවක ණය | රු. 1,034,008.00 |
| ණය හිමියෝ | රු. 2,753,339.64 |
| එකතුව | **රු. 35,932,259.42** |

**7.2. <u>2026. 03.31 දිනට බැංකු සැසඳුම් වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.</u>**

2026.03.31 දිනට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගිණුම් අංක 2758780 දරන පොදු ජංගම ගිණුම, අංක 81618288 දරන සේවක ණය ජංගම ගිණුම, අංක 2759057 දරන කර්මාන්ත ජංගම ගිණුම යන බැංකු ගිණුම්වලට අදාළ බැංකු සැසඳුම් වාර්තා ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් සභා ගත කරන ලදී.

**7.3. <u>2026.03.31 දිනට හිඟ ආදායම් වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.</u>**

2026.03.31 දිනට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ හිඟ ආදායම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් සභා ගත කරන ලදී.

| ආදායම් ශීර්ෂය | බෙන්තොට/ඉඳුරුව/හබුරුගල |
|---|---|
| 1. වරිපනම් බදු | රු. 5,237,695.95 |
| 2. අක්කර බදු | රු. 188,276.00 |
| 3. 1 % බදු | - |
| 4. කර්මාන්ත /ව්‍යාපාර බදු | රු. 12,900.00 |
| 8. වෙළඳ ස්ථාන කුළී | - |
| 10. වෙළඳ බලපත්‍ර ගාස්තු | රු. 8,000.00 |
| 12.ප්‍රචාරණ දැන්වීම් පුවරු ගාස්තු | - |
| **එකතුව** | **රු. 5,446,871.95** |

**7.4.** **<u>ගෙවීම් වවුචර් අනුමත කිරීම.</u>**

| **අනු අංකය** | **වවුචර් අංකය** | **ආදායකයාගේ නම** | **ගෙවීම් විස්තරය** | **ගෙවන මුදල (රුපියල්)** |
|---|---|---|---|---|
| 01 | | Local Loans & Development Fund | බෙන්තොට පොදු වෙළඳපොළ හා මහජන පුස්තකාලය සහිත දෙමහල් ගොඩනැගිල්ල ඉදි කිරීමට අදාල දේපළ ණය හා සංවර්ධන අරමුදල මේ දක්වා අප වෙත නිකුත් කර ඇති රු. 18,083,912.00 යන ණය මුදල සඳහා 2026 අප්‍රේල් මාසයට ගෙවිය යුතු වාරික හා පොළී මුදල්වල එකතුව ස්ථාවර නියෝගයක් මඟින් ගෙවීම | රු. 229,408.36 |
| 02 | | Local Loans & Development Fund | ගෝනගල පොදු වෙළඳපොළ සංකීර්ණය සහිත දෙමහල් ගොඩනැගිල්ල සඳහා දේශීය ණය සංවර්ධන අරමුදලින් මේ දක්වා අප වෙත නිකුත් කර ඇති රු. 33,038,362.79 යන ණය මුදල සඳහා 2026 අප්‍රේල් මාසයට ගෙවිය යුතු වාරික සහ ණය මුදල් ගෙවීම. | රු. 425,515.29 |
| 03 | | ගෝනගලපුර ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ශාන්ති වැඩිහිටි සංවිධානයේ ගි.අ. 215011500002 | කයිකාවල, බණ්ඩාරිගොඩ, හබක්කල මාර්ගය තාර යොදා ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියේ රඳවුම් මුදල් නිදහස් කිරීම | රු. 124,392.59 |

| | | | | |
|---|---|---|---|---|
| 04 | | රන්තොටුවිල ප්‍රජා මූල බැංකුවේ සමෘද්ධි ප්‍රජා මූල සංවිධානයේ ගි.අ. 2257154 | රන්තොටුවිල ආචාරියවත්ත වටරවුම් මාර්ගය තාර යොදා ප්‍රතිසංස්කරණය කිරීමේ රඳවුම් මුදල් නිදහස් කිරීම | රු. 90,000.00 |
| 05 | | බෙන්තොට ලංකා බැංකුවේ අංගාගොඩ පිටාරඹ වැඩිහිටි සමිතියේ ගි.අ. 72576318 | බලිවල කසල බැහැර කරනු ලබන ස්ථානයේ අභ්‍යන්තර ගමන් මාර්ගය සකස් කිරීමේ ව්‍යාපෘතියේ රඳවුම් මුදල් නිදහස් කිරීම | රු. 198,993.52 |

ඉහත ගෙවීම් වවුචර් ගෙවීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**7.5.** <u>**වෙනත් ලේඛන සභාවට ඉදිරිපත් කිරීම.**</u>

7.5.1. අංක බෙන්/6/1/11 හා 2026.03.20 දිනැතිව බෙන්තොට ප්‍රාදේශීය ලේකම් විසින් "නව නිල සෙවන කාර්යාලය ඉදි කිරීම මාලවල ග්‍රාම නිලධාරී වසම" මැයෙන් යුතුව ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

නිල සෙවන කාර්යාලයක් පවත්වාගෙන යාම සඳහා පමණක් ලබා දීමෙන් ජනතාවට පොදු පරිහරණයට ඉඩක් නොලැබෙන බැවින් මෙම නව ගොඩනැගිල්ලේ ප්‍රජා ශාලාවක් ද ඉදි කිරීම සුදුසු වන බවත්, තාක්ෂණ සේවා නිලධාරීතුමන් සමඟ ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ඒ අනුව ඉදිරියේ දී තීරණයක් ගැනීම සුදුසු වන බවටත් මෙහි දී තීරණය කරන ලදී.

**8.** **වෙනත් කරුණු**

**8.1.** <u>**ටෙන්ඩර් හා මිල ගණන්**</u> **:-** නැත

**8.2.** <u>**ඇස්තමේන්තු හා ගිවිසුම් සහාගත කිරීම**</u> **:-**

8.2.1. <u>ඇස්තමේන්තු අංක 01 :-</u>

ව්‍යාපෘතියේ නම :- හබුරුගල සූරියගම මැද පාර කොන්ක්‍රීට් කිරීම

මුදල :- රු. 558,267.63

8.2.2. <u>ඇස්තමේන්තු අංක 02 :-</u>

ව්‍යාපෘතියේ නම :- බෙන්තොට ආදාහනාගාරයේ ඇලුමිනියම් දොරවල් සහ වැහිපීලි සකස් කිරීම

මුදල :- රු. 449,801.00

8.2.3. <u>ඇස්තමේන්තු අංක 03 :-</u>

ව්‍යාපෘතියේ නම :- ආදාහනාගාරයේ පොළව ටයිල් කිරීම

මුදල :- රු. 1,995,114.50

ඉහත ඇස්තමේන්තු පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී නදීෂාන් වික්‍රමරත්න මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

**8.3. <u>ගරු මන්ත්‍රීතුමන්ලා/ ගරු මන්ත්‍රීතුමියන්ලාගේ අදහස් ප්‍රකාශ කිරීම :-</u>**

**<u>ගරු මන්ත්‍රී, ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා</u>**

මහ ඉඳුරුව රජයේ බෙහෙත් ශාලාව ඉදිරිපිට කාණු පද්ධතිය මේ වන විට මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් සකස් කරමින් පවතින බවත්, මේ මාර්ගය දිගේ පැමිණෙන වතුර පාර තේක්කවත්ත මාර්ගයට වැටෙන බවත්, මෙම මාර්ගය ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගයක් වන බැවින් හා මාර්ගයේ අනෙක් පසින් වතුර බටය ගලා යන බැවින් ගරාජය පැත්තෙන් කාණු පද්ධතිය සකස් කර දෙන ලෙස ප්‍රදේශවාසීන්ගෙන් ඉල්ලීමක් තිබෙන බවත්, ඒ අනුව එම මාර්ගය හරහා බෝක්කුවක් දැමීමට සිදුවන බවත්, ස්ථානීය පරීක්ෂාවක් සිදු කිරීම සුදුසු වන බවත්, සම්බන්ධීකරණ කමිටුවට ද මෙම ඉල්ලීම ඉදිරිපත් කළ බවත්, මේ සඳහා අවධානය යොමු කරන ලෙසත් සඳහන් කරන ලදී.

- මෙම අවස්ථාවේ දී පෙ.ව. 11.30 ට ගරු මන්ත්‍රී රුසිත නන්දන තුෂාර මැතිතුමා ගරු සභාවෙන් පිටව යන ලදි.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**

පසුගිය දිනක එම ස්ථානය පරීක්ෂා කිරීම සඳහා ගිය බවත්, එහි දී තේක්කවත්ත පන්සලේ නායක ස්වාමීන් වහන්සේ ද එම ස්ථානයට බෝක්කුවක් දමා ජල පහර ගරාජය පැත්තෙන් බැස යන ලෙස සකස් කර දෙන ලෙස ඉල්ලීමක් කළ බවත්, ඉදිරියේ දී එම ස්ථානය සඳහා සුදුසු විකල්පයක් යොදන බවත් මෙහි දී සඳහන් කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී, ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා</u>**

දෙද්දුව හන්දියේ පවත්වාගෙන යන අනවසර ටුක් ටුක් ගරාජය මඟින් විශාල පාරිසරික හානියක් සිදුවන බවත්, එම ස්ථානයේ සිදු කරනු ලබන්නේ යම් පින්තාරු කිරීමේ ක්‍රියාවලියක් බවත්, දෙවරක් එම ස්ථානය පරීක්ෂා කිරීමට ගිය බවත්, එක් අවස්ථාවක දී ගරු මන්ත්‍රී නිශාන්ත පෙරේරා මැතිතුමා ද පැමිණි බවත්, මෙම ස්ථානය මඟින් විශාල පාරිසරික දූෂණයක් සිදුවන බවත්, කිසිදු ආවරණයක් නොමැතිව මෙම ස්ථානයේ පින්තාරු කිරීම් සිදු කරන බවත්, මේ සම්බන්ධව මධ්‍යම පරිසර අධිකාරිය විසින් දෙවන වරට සිදු කරන ලද සිහි කැඳවීමේ ලිපිය ද පවතින බවත්, මේ සම්බන්ධයෙන් ද සලකා බලා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත් සඳහන් කරන ලදී.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**

පරිසර බලපත්‍රය ලබා දීම සිදු කර තිබෙන්නේ මධ්‍යම පරිසර අධිකාරියෙන් වන බැවින් එය අත්හිටුවීමේ හැකියාව පවතින්නේ ද එම ආයතනයට වන නිසා මෙය එම ආයතනය විසින් සිදු කළ යුතු වූවක් වන බවත්

ඒ සඳහා අවශ්‍ය යම් සහයෝගයක් වෙතොත් සභාව මඟින් ලබා දීමට කටයුතු කරන බවට එම ආයතනය වෙත දන්වා යැවූ බවත් මෙහි දී සඳහන් කරන ලදී.

__ගරු මන්ත්‍රී, ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා__
සිහිකැඳවීම් ලිපියේ සඳහන් වන්නේ මෙය අනවසර ඉදි කිරීමක් ලෙස වන බැවින් ඒ පිළිබඳ යම් පැහැදිලි කිරීමක් ලබා දෙන ලෙස සඳහන් කරන ලදී.

__ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා__
එම ස්ථානයේ පින්තාරු සිදු කිරීම් ආරම්භ කර දැනට අවුරුද්දක පමණ කාලයක් පමණක් වන බවත්, මින් පෙර එම ස්ථානයේ කොවිඩ් කාල සීමාවේ දී සංචාරකයින් ප්‍රවාහනය සඳහා යොදා ගත් බස් රථ ගාල් කර තැබීම සඳහා යොදා ගත් බවත්, එහි පරිසර ගැටලු සම්බන්ධ නීත්‍යානුකූල කටයුතු පිළිබඳ තමන් හට අවබෝධයක් නොමැති බවත්, මෙම ව්‍යාපාර ස්ථානය මින් පෙර යාලගම ප්‍රදේශයේ පවත්වාගෙන ගිය බවත්, මෙම ඉඩම දෙද්දූව ප්‍රදේශයේ වෛද්‍යවරයෙකුට අයත් වන්නක් වන බවත් සඳහන් කරන ලදී.

__ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා__
නීත්‍යානුකූලව සභාව විසින් මෙම ස්ථානය සඳහා අවසර ලබා දී තිබේ ද, මේ සඳහා පරිසර බලපත්‍රය ලබා ගෙන තිබේ ද ආදිය සලකා බලා සභාව මඟින් සිදු කිරීමට අවශ්‍ය යම් නීතිමය කටයුත්තක් තිබේ නම් එය සිදු කිරීමට කටයුතු කරන බව මෙහි දී සඳහන් කරන ලදී.

__ගරු මන්ත්‍රී, ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා__
පළමු ස්ථානීය පරීක්ෂණය සිදු කළ දිනයේ දී ඔවුන් අනාරක්ෂිතව වැඩ කරන අයුරු දුටු බවත්, සමහර අවස්ථාවල දී දිවා රාත්‍රී දෙකම එහි කටයුතු කරන බව පැවසූ බවත්, එම ස්ථානයේ දක්ෂ දරුවන් පිරිසක් අධ්‍යාපනයේ යෙදෙන බවත්, එහි නිවැසියන්ට ශ්වසන රෝග වැළඳී ඇති බවත්, තොරතුරු අනුව එම ස්ථානයට අවට සිටින දරුවන් ද ශ්වසන රෝගවලට ගොදුරු වී ඇති බවට පවසන බවත්, තින්ත ටින්, ටයර් කැබලි එකට දමා පුළුස්සමින් සිටින බව තමන් දුටු බවත්, කළු දුමාරයක් අවට පුරා පැතිරී ගිය බවත්, මෙහි සිටින පුද්ගලයන් මත්ද්‍රව්‍ය භාවිත කරන බවට ප්‍රදේශවාසීන්ගෙන් තොරතුරු ලැබුණු බවත්, මේ නිසා මේ සඳහා අවධානය යොමු කරන ලෙසත් සඳහන් කරන ලදී.

__ගරු මන්ත්‍රී, තාරක විජේකෝන් මැතිතුමා__
බෙන්තොට ආදාහනාගාරයට යන මාර්ගයේ දෙපස ගස්වල අතු පාරට බර වී ඇති බැවින් වාහන ගමනාගමනයට බාධා සිදුවන බවත්, ඒ වගේම බෙන්තොට ආදාහනාගාරයේ සහ බෙන්තොට පාලම අසල නාම පුවරු මෙතෙක් සවි වී නොමැති බවත්, ලබන මාසය වන විට අප සභාවට පත් වී වර්ෂයක් සම්පූර්ණ වන බව ද, මේ වර්ෂය ඇතුලත මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද සමහරක් සුළු සුළු යෝජනා මෙතෙක් ඉටු නොවූ බව ද, ඒ සම්බන්ධව අවධානය යොමු කරන ලෙස ද, සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කළ යෝජනා අතරින් ද මෙතෙක් ඉටු නොවූ යෝජනා පවතින බැවින් ඒවා ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදු කරන ලෙස ද සඳහන් කරන ලදී.

__ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා__
විදුලි පහන් කණු ඉවත් කිරීමට අදාළව සම්බන්ධීකරණ කමිටුවෙන් විදුලිබල මණ්ඩලය වෙත දැනුවත් කළ ද ඔවුන් කල්මරමින් සිටින බවත්, සම්බන්ධීකරණ කමිටුව සඳහා මන්ත්‍රීවරුන්ට සහභාගී වීමේ

නොහැකියාව දිගින් දිගටම පැවතීම ද මේ සඳහා බලපෑමක් වන බවත්, පළමු සම්බන්ධීකරණ කමිටුවේ දීම නිශාන්ත පෙරේරා මැතිතුමාට ක්ෂණිකව විසඳුමක් ලබා දීමට නොහැකි වූ මාතෘ සායනයේ කටයුතු සභාව මැදිහත් වී සිදු කළ බවත්, ඊට අමතරව සම්බන්ධීකරණ කමිටුවේ ඉල්ලීම් සියල්ල ඊළඟ සම්බන්ධීකරණ කමිටුවට පෙර සිදු කිරීමට මෙතෙක් කල් කටයුතු කළ බවත්, දිගින් දිගටම සම්බන්ධීකරණ කමිටුව සඳහා මහජන නියෝජිතයින්ට සහභාගී වීමට අවස්ථාව ලබා නොදුන්නොත් එලෙස කටයුතු සිදු කිරීම ද නැවැත්වීමට සිදුවන බවත්, තම ප්‍රදේශයට ජල පහසුකම් නොමැති බවත්, අනෙක් ප්‍රදේශවලට ප්‍රජා ජල ව්‍යාපෘති ලබා දුන්න ද තම ප්‍රදේශයට ලබා නොදීම පිළිබඳ ගම් වැසියන්ගෙන් චෝදනා එල්ලවන බවත්, තම කොට්ඨාසය නියෝජනය කරන එකම මන්ත්‍රීවරයා තමන් වන නමුත් දැනට ප්‍රජා ශක්ති කමිටු ගණනාවක් පවත්වා ඇති නමුත් ඒ පිළිබඳ තමන් දැනුවත් නොකළ බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා</u>

ප්‍රාදේශීය ලේකම්තුමන් වෙත සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් වීමට අවස්ථාව ඉල්ලා මෙතෙක් ඉල්ලීමක් නොකළ බැවින් ඉල්ලීමක් සිදු කරන ලෙස ද, තම පක්ෂය විසින් ද ඒ සම්බන්ධව ඉල්ලීමක් සිදු කරන බව ද, ප්‍රජා ජල ව්‍යාපෘති ගැටලුව පිළිබඳ අවබෝධයක් නොමැති බවත්, තවමත් ප්‍රජා ජල ව්‍යාපෘති සඳහා ඉඩකඩ පවතින බවත් සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

දිස්ත්‍රික් ලේකම්, ආණ්ඩුකාරතුමා මෙන්ම ජනාධිපතිතුමා දක්වා ලිඛිතව ඉල්ලීම් සිදු කර යවා ඇති බවත්, මෙතෙක් සම්බන්ධීකරණ කමිටුවට සහභාගී වීමට අවස්ථාව ලබා නොදුන් බවත්, මේ වන විට ජල ව්‍යාපෘති සම්බන්ධයෙන් ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බවත්, නමුත් ප්‍රථමයෙන් ඉල්ලීම් සිදුකිරීමට නොහැකි වූයේ දේශපාලනික ක්‍රියා හමුවේ වන බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා</u>

සම්බන්ධීකරණ කමිටුවට සහභාගී වීමට නොහැකි වීමේ ගැටලුව සම්බන්ධයෙන් ඉල්ලීමක් සිදු කිරීමට ඉදිරිපත් වීම සම්බන්ධයෙන් කොඩිතුවක්කු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වන බවත්, සම්බන්ධීකරණ කමිටුවේ දී සමහර අවස්ථාවල දී එම මොහොතේ මතුවන ගැටලු පවතින බවත්, එම ගැටලු සඳහා ග්‍රාම නිලධාරී, සංවර්ධන නිලධාරී හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරියා වෙතින් පිළිතුරක් ලබා ගත නොහැකි වන නමුත් මහජන නියෝජිතයින් විසින් ප්‍රදේශයේ සියලු දේ පිළිබඳ මනා දැනීමක් සහිත වන බැවින් ඔවුන් මඟින් අදාළ ගැටලු නිරාකරණය කර ගැනීමේ හැකියාව පවතින බවත්, ප්‍රජා ශක්ති කමිටුවල සභාපති පත් කරනු ලබන්නේ සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයාගේ නියෝජිතයා ලෙස වන බවත්, සමාජවාදය පිළිබඳ වැඩිපුරම කතා කළ කණ්ඩායම අද වන විට ඒකාධිපති පාලනයේ උපරිමයට ගොස් ඇති බවත්, සියලු සමිති සමාගම්වල සභාපති ධුර ලබාගෙන සිටිය ද අවබෝධයක් නොමැති බවත්, කන්න රැස්වීම් පවත්වා මිනිස්සුන්ට අවශ්‍ය පොහොර ටික ලබා දීමට පවා මේ වන විට ඔවුන් අසමත්ව ඇති බවත් මෙහි දී සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, නිශාන්ත කුමාර මැතිතුමා</u>

ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට සභාවේ මන්ත්‍රීවරයෙක් සහභාගී වීමට ගොස් ඔහුව ප්‍රතික්ෂේප කළ අවස්ථාවක් පවතී ද, ලිඛිතව ඉල්ලීමක් මේ සම්බන්ධයෙන් සිදු කර තිබේ ද ලෙස මෙහි දී විමසන ලදී.

- මෙම අවස්ථාවේ දී පෙ.ව. 11.50 ට ගරු මන්ත්‍රී නිලුපුල් සම්පත් මැතිතුමා ගරු සභාවෙන් පිටව යන ලදී.

<u>**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**</u>
මන්ත්‍රීතුමා පසුගිය කාලයේ අසනීප තත්ත්වය මත සභා රැස්වීම් සඳහා සහභාගී නොවූ බවත්, එම කාල සීමාවේ දී මේ සඳහා සහභාගී විය හැක්කේ සභාපති, උප සභාපති සහ විපක්ෂයේ මන්ත්‍රීවරු දෙදෙනෙක් පමණක් ලෙස චක්‍රලේඛයක් නිකුත් වූ බවත් සඳහන් කරන ලදී.

<u>**ගරු උප සභාපති, ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා**</u>
අද අප්‍රේල් මස 21 වන දින පාස්කු ප්‍රහාරය එල්ල වී වසර 7 ක් ගත වී ඇති බව සිහිපත් කරන බවත්, බැකෝ යන්ත්‍රය මේ වන විට ක්‍රියාකාරි තත්ත්වයේ පවතින බැවින් මීට ඉහත දී මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කළ යෝජනා ගොනුගත කොට ක්‍රමවේදයක් සකස් කොට කොට්ඨාස සියල්ල සඳහා එහි ප්‍රයෝජනය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත්, ලැබුවා වූ සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් සියලු දෙනාට සුභ පතන බවත් මෙහි දී සඳහන් කරන ලදී.

<u>**ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා**</u>
කොට්ඨාස 13 ට බෙදී යන ලෙස එම යෝජනා සියල්ල ඇතුළත් කොට සටහනක් කලින් සාදා ඒ ඒ කොට්ඨාසයේ සිටින මන්ත්‍රීවරුන්ටත් සහභාගී වීමට හැකිවන ලෙස කටයුතු කිරීම සුදුසු බවත්, එසේ නොමැතිව බැකෝ යන්ත්‍රය සියලු දෙනාම එකවර ඉල්ලුම් කිරීමට යාමේ දී මන්ත්‍රීවරු දැඩි පීඩාවකට පත්වන බවත්, මේ සම්බන්ධයෙන් ලේකම්තුමාගේ අවධානය යොමු කරන ලෙසත් සඳහන් කරන ලදී.

<u>**ගරු මන්ත්‍රිනී, ලෙනිකා දූෂන්ති මැතිතුමිය**</u>
මේ දිනවල බලශක්තිය පිරිමැසීම වෙනුවෙන් සවස 6 ත් රාත්‍රී 10 ත් අතර විදුලි පහන් කණු නිවා දැමීමට දැනුවත් කර තිබෙන බවත්, නමුත් බෙන්තොට පාලමේ විදුලිය සම්පූර්ණයෙන්ම අක්‍රීය කර ඇති බවත්, මේ නිසා හොරුන්ට තෝතැන්නක් වී ඇති බවත්, විදුලි පහන් කණුවල කොටස් ගලවාගෙන ගොස් ඇති බවත්, මෙය මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් සිදු කර ඇති බැවින් නැවත බෙන්තොට පාලමේ විදුලිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසටත් සඳහන් කරන ලදී.

<u>**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**</u>
මෙය බෙන්තර පාලමට පමණක් සිදු වූවක් නොවන බවත්, මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් පාලනය වනු ලබන ගාලු දිස්ත්‍රික්කයේ සියලු පාලම්වල විදුලිය මේ දිනවල අක්‍රීය කර ඇති බවත්, මේ දිනවල රාත්‍රී කාලයේ දී පවා zoom තාක්ෂණය ඔස්සේ රැස්වීම් පවත්වමින් විදුලිය පිරිමැසීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන බවත්, කාර්යාලය තුළ ද මෙම දින කිහිපයේ සමහරක් විදුලි බල්බ නිවා දමා විදුලිය පිරිමසමින් රාජකාරී කටයුතු සිදු කළ බවත් සඳහන් කරන ලදී.

<u>**ගරු උප සභාපති, ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා**</u>
මාර්ග ආරක්ෂණ කමිටුවේ දී ද මේ පිළිබඳ සාකච්ඡා කළ බවත්, ගාලු දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක වන සියලු පාලම්වල විදුලිය මේ දිනවල අක්‍රීය කර ඇති බව එහි දී දැනුම් දුන් බවත් සඳහන් කරන ලදී.

**8.4.** **<u>ගරු මන්ත්‍රීතුමන්ලා/ ගරු මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරීම :-</u>**

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් අද දින සභාවට නොපැමිණි ගරු මන්ත්‍රී ලියනගමගේ විජිත් සම්පත් මැතිතුමාගේ නිවාඩු ඉල්ලීම් ලිපිය ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

ඉහත මන්ත්‍රීතුමාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ප්‍රනාන්දු මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා:-</u>**
මෙතෙක් වෙලා සභාවේ රැඳී සිටිමින් සහයෝගය ලබා දුන් ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරු 19 දෙනාට ස්තූතිවන්ත වන බව පවසමින් ගරු සභාපතිතුමා විසින් සභා රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

ප.ව. 12.10 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් විය.

ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා,
සභාපති,
බෙන්තොට ප්‍රාදේශීය සභාව.